# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,224 — 1921ක්වූ නොවැම්බර් මස 11වෙනි දිනවූ සිකුරාද.


# Part IV.— හතරවෙනි කාණ්ඩය.

---

## ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද ප්‍රකාශපත්‍රයයි.

මහාබ්‍රිතාන්‍යය සහ අයර්ලන්තයත් යන එක්සත් රාජධානියේද, මුහුදින් එතර බ්‍රිතාන්‍ය රටවලද රාජාභිෂේකලත් සමය සංරක්ෂකවූ අනේකශ්‍රීන් විරාජමානවූ **පස්වෙනි ජෝර්ජ්** රජ්ජුරුවන්වහන්සේගේ නාමයෙන්ය.

සෙන්ට් මයිකල් සහ සෙන්ට් ජෝර්ජ් යන අතිවිශිෂ්ට පඞ්ක්තියේ නයිට් ග්‍රෑන්ඩ් ක්‍රොස්වූද, බ්‍රිටිෂ් ඇම්පයර් යන අති
අනඝ පඞ්ක්තියේ නයිට් කොමැන්ඩර්වූද, බාත් යන අතිගරුකටයුතු පඞ්ක්තියේ කොම්පැනියන්වූද
ලංකාද්වීපයේ සහ ඊට අයත් ප්‍රදේශවල ආණ්ඩුකාර ධුරන්ධර ප්‍රධාන සේනාධිපතිවූ සර් විලියම්
හෙන්රි මැනින් උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද

ප්‍ර කා ශ ප ත්‍ර ය යි.

ඩබ්ලිව්. එච්. මැනින්.

වර්ෂ 1910යේ නොම්මර 6යේ ආඥාපනතේ 109 (1) වෙනි වගන්තියේ සහ වර්ෂ 1919යේ නොම්මර 2යේ ආඥාපනතේ 195වෙනි වගන්තියේ පංගාඩම් යටතේ කොළඹ නාගරික සභාව විසින් සාදනලද මෙහි පහත දක්වන උපාංගනීති වර්ෂ 1910යේ නාගරික සභා ආඥාපනතේ 109 (3) වෙනි වගන්තියේ පංගාඩම් ප්‍රකාර කාරක මන්ත්‍රී සභාවේ කැමැත්ත ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලද්දේය.

එබැවින් මෙහි A සහ B යන ලේඛනවල සඳහන්කර තිබෙන එම උපාංගනීති ආණ්ඩුකාරතුමා වන අප විසින් මෙයින් එළිදරව්කර සිටින බව සියලුදෙනා විසින් දතයුත්තේය.

අප ස්වාමීන්වහන්සේගේ වර්ෂයෙන් එක්දහස් නවසිය විසිඑකක්වූ නොවැම්බර් මස අටවෙනි දින එම ලංකාද්වීපයේ කොළඹදී දෙවාවදාරණලද්දේය.

ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණලෙස,

ග්‍රීම් තොම්සන්,
මහසෙක්‍රතාරිස් වම්ශ.

අප මහරජාණන් දෙවියෝ රක්ෂාකෙරෙත්වා.

---

### කියනලද ලේඛන.

### A ලේඛනය.

උපාංගනීති.—ප්‍රසිද්ධ වැසිකිළි පාවිච්චිකරන අයගේ ශෝභන හැසිරීම විධානකිරීම සඳහා වර්ෂ 1919යේ නොම්මර 2 දරණ ආඥාපනතේ 195 (*a*) වෙනි වගන්තිය යටතේ කරනලද උපාංගනීතිය.

1. යම් ප්‍රසිද්ධ වැසිකිළියක තබා තිබෙන භාජනවල ඇර වෙන ස්ථානයක පැහැරීම හෝ මුත්‍රාකිරීමට සපයා තිබෙන ස්ථානවල ඇර වෙන ස්ථානයක මුත්‍රාකිරීම හෝ කිසිවෙකු විසින් නොකළයුතුයි.

2. ප්‍රසිද්ධ වැසිකිළියක රෙදි හෝ එබඳු වෙන දේ හෝ බලන්, තැටි හෝ ගෙවල්වල පාවිච්චිකරන වෙන භාජනාදිය සේදීම හෝ සතුන් නැවීම හෝ කිසිවෙකු විසින් නොකළයුතුයි.

3. ප්‍රසිද්ධ වැසිකිළියක හෝ එහි තුළ තිබෙන නැටිවල සිදුරුවල හෝ කානුවලට ඇර තිබෙන වෙන විවෘත ස්ථානවල ගල් පස් අළු හෝ එම කානුවලින් සෝදායන්ට අදහස්කර නැති කිසි ද්‍රව්‍යයක් හෝ වස්තුවක් හෝ හෙළීම හෝ තැබීම කිසිවෙකු විසින් නොකළයුතුයි.

4. ප්‍රසිද්ධ වැසිකිළියක තිබෙන නැටිය පයිප්ප නාලිවාර නටාක හෝ එහි සවිකර තිබෙන වෙනයම් දේකට හෝ උපකරණාදියකට අලාභකිරීම එය ගෙනයෑම හෝ ඊට අවහිරකම්කිරීම හෝ එය සවිකර තිබෙන තැන හෝ තබා තිබෙන හෝ

තැන් පිළිවෙළ වෙනස්කිරීම හෝ එබඳු වැසිකිළි ගොඩනැගිල්ලේ බිත්ති බිම වහල හෝ වෙන යම් කොටසක් කඩාදැමීම හෝ පලුදුකිරීම හෝ ඊට අලාභකිරීම හෝ කැතකිරීම කැමැත්තෙන්ම කිසිවෙකු විසින් නොකළයුතුයි.

5. ප්‍රසිබ වැසිකිළියක තමන්ගේ පක්ෂයේ නොවන්නාවූ අයවලුන්ගේ පාවිච්චිය පිණිස වෙන්කර තිබෙන යම් කොටසකට හෝ එබඳු වැසිකිළියක එවකට වසා තිබෙන හෝ පාවිච්චිකිරීමට තහනම්කර තිබෙන කොටසකට ඇතුල්වීම මෙහෙයෙහි නියුක්තව සිටින ප්‍රසිබ මූලාදෑනියෙකුට හෙවත් වෙන් අයෙකුට හැර අන්‍ය කිසිවෙකුට යුතුනැත.

6. ප්‍රසිබ වැසිකිළියක යම් මෙහෙකරුවෙකු හෝ මුරකරුවෙකු හෝ භාරකාරයෙකු විසින් තමාගේ වැඩේ කටයුතු කිරීමේදී යුතු අන්දමට දෙන් නියෝගයකට විරුඬව මැදහත්වී ක්‍රියාකිරීම හෝ හිරිහැරකිරීම හෝ අකීකරුවීම කිසිවෙකු විසින් නොකළයුතුයි.

7. එය පිහිටුවා තිබෙන කාරණයට හැර ප්‍රසිබ වැසිකිළියකට නිතර යෑම හෝ එහි නැවතීම හෝ කිසිවෙකු විසින් නොකළයුතුයි.

8. බෝවෙන රෝගයකින් පෙළෙන කිසි කෙනෙක් ප්‍රසිබ වැසිකිළියකට ඇතුල්විය යුතුනොවේ.

9. දඬුවම්.—මෙම උපාඞගනීතිවල යම් පංගාඩමක් යමෙක් කඩකර වරදකාරයෙක්වීනම් ඔහු රුපියල් 50කට වැඩි නොවන දඩයකින් අච්චුලබන්ට සුදුස්සෙක් වන්නේය.

## 13. ලෙඛනය.

උපාඞගනීති—කානු වැසිකිළි සහ වෙනත් සනීපාරක්ෂක උපකරණාදිය සෝදිසිකිරීම සහ ශුඬකිරීම සඳහා ගාස්තුව නියම කිරීම, අයකිරීම සහ එකතුකිරීම ගැනත් කානු සෑදීමේ වැඩකරන අයට අවසරපත්‍ර නිකුත්කිරීම නියමකිරීම ගැනත් එකී අවසරපත්‍ර මොන කොන්දේසිපිට නිකුත්කිරීම සහ පාවිච්චිකිරීම යුතුද එකී වැඩ මොනඅන්දමේ කටයුතුද එකී අවසරපත්‍ර සෝදිසිකර බැලීමට සහ එය සඳහා ගෙවියයුතු මුදල් අයකිරීමටද එහි නියමවලට විරුඬව ක්‍රියාකරන්ට යෙදුනොත් ඒ ගැන රුපියල් එකසියයකට වැඩිනොවන දඩයක් අයකිරීමටද වර්ෂ 1919යේ 2වෙනි ආඥාපණතේ 195වෙනි වගන්තිය යටතේ සාදනලද්දේය.

වර්ෂ 1919යේ 2වෙනි ආඥාපණතේ 195 (*b*) සහ (*c*) වෙනි වගන්තිවල පංගාර්තු යටතේ අවසරලත් කානු සාදන කොන්ත්‍රාත්කාරයින් ගැන සහ කානු සෝදිසිකිරීම සහ ශුඬකිරීම ගැනත් උපාඞගනීති.

තේරුම් විසඳීම—මෙම උපාඞගනීති සඳහා නගර සනීපාරක්ෂක ඉංජිනේරුතැන යන්නෙන් අදහස්කරන්නේ කොළඹ නාගරික සභාවේ සනීපාරක්ෂක ඉංජිනේරුතැන හෝ කොළඹ නාගරික සභාවේ ප්‍රධානතැන විසින් මෙහි පහත දක්වන යම් කානු සම්බන්ධ වැඩක වැඩ කරවීම හෝ කානු වැසිකිළි සහ වෙනත් සනීපාරක්ෂක උපකාරණාදිය පවත්වාගැනීම සහ සුඬකිරීම හැසිරවීමට හෙවත් සෝදිසිකර බැලීමට නියම අන්දමට පත්කර සිටින මූලාදෑනියෙක්වේ.

### Iවෙනි කාණ්ඩය.

### කානු සෝදිසිකිරීම සහ ශුඬකිරීම සම්බන්ධයි.

1. කානු සම්බන්ධ වැඩ සෝදිසිකිරීමට සහ පරීක්ෂාකර බැලීමට මෙහි පහත සඳහන්කර තිබෙන ගාස්තුව ගෙවිය යුතුයි. එකී ගාස්තු වැඩකරන්ට භාරගත් කොන්ත්‍රාත්කාරයා විසින් ප්‍රධානතැනට ගෙවිය යුතුයි:—

(1) යම් ගොඩනැගිලිවලටත් ඉඩම්වලටත් කානු සෑදීමට හෝ යම් ගොඩනැගිලිවලවත් ඉඩම්වලවත් කානු වෙනස් කිරීමට හෝ වැඩිපුර එකතුකිරීමට ඔප්පුකරන්ටයෙදී ඒත්තුගන්නාලද වෙන්වශයෙන් කරන එක එක ඉල්ලුම් පත්‍රයකට රු 5.

(2) එක එක ඉල්ලුම්පත්‍රය යටතේ ඇතුල් කානුවලට හෝ වැහි වතුර කානුවලට හෝ එකකට වැඩියෙන් ඉල්ලාසිටින එක එක යාකිරීමට—රු 5.

(3) එක එක ඉල්ලුම් පත්‍රය යටතේ දෙකකට වැඩියෙන් ඉල්ලාසිටින එක එක වැසිකිළි භාජනයට රු—3.

(4) එක එක ඉල්ලුම් පත්‍රය යටතේ කානු කොන්ත්‍රාත්කාරයා විසින් අසම්පූර්ණ ලෙසවත් නොකට යුතු ලෙසවත් වැඩ කිරීමෙන් නගර සනීපාරක්ෂක ඉංජිනේරුතැනගේ කල්පනාවේ හැටියට උවමනාකරන්නාවූ එක එක වැඩිපුර අන්තිම සෝදිසිකිරීමට—රු 5.

2. කානු වැසිකිළි සහ වෙනත් සනීපාරක්ෂක උපකරණ සුඬකිරීමට ගෙවියයුතු ගාස්තු.

(1) කානුවල අවහිරවී තිබෙන ස්ථාන ඇතුළුව කානු සුඬකිරීමට හෝ වැසිකිළි හෝ වෙනත් සනීපාරක්ෂක උපකරණාදිය සුඬකිරීමට මෙහි පහත දක්වන ගාස්තු ගෙවියයුතුයි. එකී ගාස්තු එය ඉඩමේ හෙවත් ගොඩනැගිල්ලේ පදිංචිකාරයා විසින් නැත්නම් පොඩිගෙවල් වශයෙන් කුලියට දී තිබෙන හෙවත් එක්කෙනෙකුගේ පදිංචිය නැති ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්නම් ප්‍රධානතැන විසින් නියමකරන්ට යෙදෙන කොටස් වශයෙන් එහි එක එක පදිංචිකාරයා විසින්ද නැතහොත් එකී ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකාරයා විසින් ගෙවියයුතුයි.

කානුවල අවහිරවී තිබෙන ස්ථාන ඇතුළුව ඉඩමක හෝ ගොඩනැගිල්ලක තිබෙන නොහොත් ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට අයිති කානු පංක්තියක් හෝ කොටසක් නොහොත් වැසිකිළි හෝ වෙනත් සනීපාරක්ෂක උපකරණාදිය හෝ එවැනි පංක්තියක් සුඬකිරීමට—රු. 5.

(2) නාගරික සභාව විසින් වැඩකර තිබේනම් එකී ගාස්තු ගෙවියයුතුවන්නේ—

(*a*) එකී ඉඩමේ හෙවත් ගොඩනැගිල්ලේ පදිංචිකාරයා හෝ අයිතිකාරයා ඉල්ලුම්කළ විටකදී සහ ප්‍රධානතැනගේ කැමැත්තේහැටියට එකී වැඩේට ගිය සම්පූර්ණ වියදම ගෙවීමට ඉඩඇතුවය.

(*b*) එසේනොහිම ක්‍රියාකරන්ට උවමනායයි කියා ප්‍රධානතැනට කල්පනාවුනවිටකදී සහ ඔහු විසින් වැඩය කරන්ට අදහස්කර තිබෙන බව සහ අයකරන්ට පුළුවන් ගාස්තු පදිංචිකාරයාට හෝ අයිතිකාරයාට දැනුම්දීය.

(3) මේ උපාඞගනීතිවල මෙම වගන්තියේ 2 (*b*) උපවගන්තිය යටතේ ගෙවියයුතු ගාස්තු ප්‍රධානතැනගෙන් ඉල්ලීමක් ලැබී හත්දවසකින් යමෙක් නොගෙවන්ට යෙදුනොත් ඔහු වරදක් කළාවේ. ඒ වරද ඔප්පුවූවිට ඔහු රුපියල් විසිපහකට වැඩිනොවන දඩයක් ලබන්ට සුදුස්සෙක් වන්නේය.

### IIවෙනි කාණ්ඩය.

කානු කොන්ත්‍රාත්කාරයින්, අවසරපත්‍ර, පොරොන්දු සහ දඬුවම්.

1. ප්‍රධාන තැනගෙන් ලියවිල්ලකින් අවසර පළමුවෙන් නොගෙන සභාවේ යුතුලෙස බලය දෙනුලැබූ මූලාදෑනින් හැර කානු සහ කානු උපකරණාදිය සෑදීමේ සවිකිරීමේ සහ වෙනස්කිරීමේ සම්බන්ධ කිසිවැඩක් කිසිවෙකු විසින් කෙරීම හෝ කෙරවීම යුතුනැත.

ප්‍රධාන තැනගෙන් ඉහතකී අවසර පත්‍රයක් ලබාසිටින්නාවූ අය හෝ සමාගම් කානු කොන්ත්‍රාත්කාරයෝය කියා මින් මතු සලකනුලැබේ.

2. යම් අයෙකුට හෝ සමාගමකට හෝ ඉහත සඳහන් කරනලද යම් වැඩක් කිරීමට අවසර පත්‍රයක් දෙන්ට මත්තෙන් එකී අය හෝ සමාගම මෙහි පහත දක්වන කාරණාවන සභාපතිතැන සතුටුකළ යුතුයි. එනම්:—

(*a*) එකී අයට හෝ සමාගමට හෝ එකී අයගේ හෝ සමාගමේ මෙහෙයෙහි යෙදී සිටින කිසිවෙකුට ප්‍රධානතැන විසින් දෙනලද අවසර පත්‍රයේ ප්‍රකාර භාරගැනීමට නියමකරන්ට හැකි එකී කර්මාන්ත හෙවත් එවැනි වර්ගයේ කර්මාන්තවල දැනගැනීමක් තිබීම.

(*b*) එකී අයට හෝ සමාගමට කර්මාන්තය කිරීම පිණිස යෝග්‍ය සහ සෑහෙන පමණ ආවුද කර්මාන්තෝපකරණය සහ ද්‍රව්‍ය තිබෙන්නාවූ සුදුසු වැඩපොළක් තිබීම.

3. කානු කොන්ත්‍රාත් කාරයෙකුට නිකුත්කරන සියලුම අවසරපත්‍ර මෙහි පහත සඳහන් කරන කොන්දේසිවලට යටත්කොට දෙනුලැබේ:—

(*a*) එකී අවසරපත්‍රය වලංගුව තිබෙන්නාවූ කාලයද එකී අවසරපත්‍රයලත් අයට භාරගන්ට බලය දී තිබෙන කර්මාන්ත වර්ගයද නාමවශයෙන් එහි සඳහන්කර තිබිය යුතුයි.

(*b*) ප්‍රධාන තැනගේ කැමැත්තපිටම අවසර පත්‍රයලත් අයට ලියවිල්ලකින් දැනුම්දී එකී අවසර පත්‍රය කොයිවේලාවේ වුනමුත් අවලංගු කිරීමට බලය තිබිය යුතුයි.

(*c*) අවසරලත් අයගේ වැඩපොල පිහිටි ස්ථානයේ නම ගම එකී අවසර පත්‍රයේ සඳහන්කර තිබිය යුතුයි.

(*d*) අවසර පත්‍රයලත් සියළුම අය විසින් ප්‍රධාන තැනභාරේ රු. 250ක් තැබිය යුතුයි. තවද ඔහු විසින් රු. 25ක් අවසරපත්‍ර ගාස්තුවක් වශයෙන් අවුරුදුපතා ප්‍රධාන තැනට ගෙවිය යුතුයි.

(*e*) එකී අවසර පත්‍රය යටතේ යම් කානු කොන්ත්‍රාත්කාරයෙකු විසින් කරනලද යම් කර්මාන්තයක් නොහොත් අයෝග්‍ය කර්මාන්තයක් ගැනවත් එකී කර්මාන්ත කරණකොටගෙණ ගොඩනැගිලිවලට හෝ දේපලවලට වන්නාවූ අලාභවලට හෝ ප්‍රධාන තැන කිසි වගකීමකට කිසි අන්දමකින් එකී අවසර පත්‍රය නිකුත් කිරීමෙන් යටත් කිරීම නොකළ යුතුයි.

4. සියලුම කොන්ත්‍රාත්කාරයින් විසින්—

(1) නාගරිකසභා ආඥාපණත්වල සහ උපාඩගනීතිවල පංගාඩම් ප්‍රකාරද එහි යටතේ විටින්විට සාදන්ට යෙදෙන නියෝගවල පංගාඩම් ප්‍රකාරද ක්‍රියාකට යුතුයි.

(2) පදිංචි ස්ථානය හෝ වැඩපොලකරන ස්ථානය මාරුකරන්ට යෙදුනේනම් ඒබව ප්‍රධානතැනට දැන්විය යුතුයි.

(3) තමන් විසින් භාරගන්ට යෙදෙන වැඩ කඩිසරලෙසට සහ වැඩකරන්ට ඕනෑ පිළිවෙළටත් කළයුතුයි. තවද සෑහෙන කරුණක් නොමැතිව නොසෑහෙන ලෙස වැඩ පරක්කු නොකළ යුතුයි.

(4) එකී වැඩ සම්බන්ධව නගර සනීපාරක්ෂක ඉංජිනේරුතැන විසින් යුතුලෙස සහ නියම අන්දමේ කරන සියලුම නියෝග පිළිපැදිය යුතුයි.

(5) කාණු කර්මාන්ත වැඩ හෝ උපකරණදිය සම්බන්ධ වැරැද්දක් දුටුකල නගරසනීපාරක්ෂක ඉංජිනේරුතැනට ඒබව දැන්විය යුතුයි.

(6) පයිප්ප සවිකරන උපකරණදිය කානු වැඩ සෝදිසිකිරීමට පරීක්ෂාකිරීමට අත්හද බැලීමට යුතුවූ කානු කර්මාන්ත හෝ ද්‍රව්‍ය සනීපාරක්ෂක ඉංජිනේරුතැනට උවමනා උපකරණදිය සපයාදීමට උවමනා ක්‍රියා සහ සෑහෙන වැඩ කළයුතුයි.

5. යම් කානු කොන්ත්‍රාත්කාරයෙකුට 2 (*a*) වෙනි උපාඩගනීතියේ සඳහන්ව තිබෙන යෝග්‍යකම් ඔහු යටතේ වැඩ කරන අයෙකුට තිබෙන නිසා අවසරපත්‍රයක් නිකුත්කර තිබේනම් එම අය ඔහු යටතේ වැඩකරන්ට අත්හිටියාම ඒබව කානු කොන්ත්‍රාත්කාරයා විසින් ප්‍රධානතැනට දන්වා සිටිය යුතුය.

6. නගර සනීපාරක්ෂක ඉංජිනේරුතැනට කිසි ප්‍රකාර නොදන්වා මීට ඉහතින් සඳහන්කර තිබෙන කිසිම කානු සම්බන්ධ කර්මාන්තවැඩ කිරීමවත් එබඳු වැඩ දෙවනු කුලියට දීමවත් එය යම් අවසරලත් කොන්ත්‍රාත්කාරයෙකුලවා කෙරවීමවත් කිසි කානු කොන්ත්‍රාත්කාරයෙකු විසින් නොකළ යුතුයි.

7. නගර සනීපාරක්ෂක ඉංජිනේරුතැන විසින් නියම අන්දමට ඒත්තුගන්ට යෙදුනොත් මිස මීට ඉහත සඳහන්වූ කානු වැඩකිරීමේදී පයිප්ප සවිකරන දේ උපකරණදිය හෝ ද්‍රව්‍යය කිසි කානු කොන්ත්‍රාත්කාරයෙකු විසින් කානු කර්මාන්ත සම්බන්ධ යම් වැඩකට පාවිච්චිනොකළ යුතුයි.

8. කානු කොන්ත්‍රාත්කාරයෙකු විසින් ඔහුගේ අවසරපත්‍රයේ පංගාඩම් යටතේ ඔහු විසින් කරන්ට යෙදෙන මොන යම් වැඩවලවත් ප්‍රධානතැන විසින් අවසරපත්‍රයක් අහක්කරගන්ට යෙදුන හෝ අවලංගුකරන්ට යෙදුන නොහොත් ප්‍රධාන තැන විසින් අවසරපත්‍රයක් දෙන්ට අකමැතිවුන කෙනෙක් පළමුවෙන් ප්‍රධානතැනට දන්වා ප්‍රධානතැනගේ කැමැත්ත ලබා නොගෙන එබඳු වැඩවල යෙදවීම කිසි කානු කොන්ත්‍රාත්කාරයෙකු විසින් නොකළ යුතුය.

9. මෙම උපාඩගනීතිවලින් එකක්වත් යම් කොන්ත්‍රාත්කාරයෙකු විසින් කඩකරන ලද්දේයයි ප්‍රධානතැනට කල්පනා වුනිනම් ඉහතකී 3 (*d*) වෙනි උපාඩගනීතියේ නියමය ප්‍රකාර ඔහු විසින් බැඳ තිබෙන මුදලෙන් ප්‍රධානතැනගේ කැමැත්ත හැටියට රුපියල් 100කට වැඩිනොවන මුදලක් දඩයක් වශයෙන් ඔහුට අපසු නොදී සිටීමට කානු කොන්ත්‍රාත්කාරයෙකුට නිකුත්කරන අවසරපත්‍රයේ කොන්දේසියක් වියයුතුයි.

---

## උපාඩගනීති.

උතුරු පළාතේ මන්නාරම් දිස්ත්‍රික්කේ සනීපාරක්ෂක සභාව විසින් වර්ෂ 1892කේ ස්ථුළනගර සනීපාරක්ෂක ආඥාපණතේ නොම්මර 9E වගන්තියේ 2වෙනි උපවගන්තිය යටතේ සාදනලදුව කාරක මන්ත්‍රණ සභාවේ සම්මතය පිට ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පිළිගන්නාලද මෙහි පහත සඳහන් අතුරුපණත් මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධකරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
ග්‍රීම් තොම්සන්,
මහලේකම් වම්භ.

වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 7වෙනි දින
කොළඹ මහාලේකම්කන්තෝරුවේදීය.

---

**අතුරුපණත්.** [9E 2 (*d*) යන වගන්තිය.]

**භෝජන ශාලා සහ පාන්ගෙවල්.**

20. (*a*) යම්කිසි භෝජන ශාලාවක හෝ තේ කෝපි කඩයක පාවිච්චිකරන සිනි විදුරුමුඩි ගසනලද පළල් කටවල් ඇති බෝතලවල තැබිය යුතුයි.

20. (*b*) විකිනීමට තබන සියලුම කේක් රසකැවිලි සහ වෙනත් කෑම ද්‍රව්‍ය මැස්සන්ගෙන් නිදහස්කොට තිබිලෙස සාදනලද විදුරු පෙට්ටිවල තැබිය යුතුයි. කිසිම කෑම ද්‍රව්‍යයක් මැස්සන් විසින් අපිරිසිදුකරනුලැබීමට නොහැරිය යුතුයි. පාවිච්චිකරන්ට යෙදෙන විදුරුපෙට්ටි ඉතා සැලකිල්ලෙන් පිරිසිදුව තබාගත යුතුයි.

20. (c) අහක යන දේ, කෝපි කිරි හෝ කෑමවල ඉතිරි කැබලි පිසීමේදී අහක යන ද්‍රව්‍ය ඊට කිසි භාජනයක එක්කාසුකර දිනපතාම ඉවත්කරනු මිස භූමියෙහි විසිනොකළ යුතුයි.

20. (d) මන්නාරමේ සනීපාරක්‍ෂක සභාවේ සභාපතිතැනගෙන් ලබනලද අවසර පත්‍රයක් නොමැතිව කිසිම පාත් ගෙයක් සනීපාරක්‍ෂක නගරයක සීමාතුළ තැබීම කිසිවෙකු විසින් නොකළ යුතුයි. ඉහතකී ස්ථාන හරියාකාර පැවැත්වීම පිණිස පැවතගෙන එන සනීපාරක්‍ෂක සභාවේ අණපණත්වලට අනුව ක්‍රියාකිරීම අනපසුකරන කාට නමුත් එම අවසරපත්‍රය දීම ප්‍රතික්‍ෂෙපකිරීමට සභාපතිතැනට බලය තිබේ. එවැනි සෑම පත්‍රවල කාලසීමාවද නියමකිරීමට බලය තිබේ. සනීපාරක්‍ෂක සභාව විසින් මේ පරිච්ඡෙදය යටතේ පාත්ගෙවල් තබාගැනීම පිණිස නිකුත්කරනලද යම් බලපත්‍රයක අණපණත් කඩකිරීමේ වරදට යම් අයෙක් යම් උසාවියක් විසින් දෙවතාවක් හෝ වැඩිගණනක් දඬුවම්කරනුලැබුවේනම් එම අවසරපත්‍රය ඒ දෙවෙනි නඩුව හෝ ඊට පසුව සිදුවන නඩුව හෝ විනිශ්චයකරන නඩුකාරතැන විසින් අවලංගුකරනු ලැබේ.

[9E 2 (e) යන වගන්තිය.]

**මස්කඩ.**

22. (a) මස්කඩවල පාවිච්චිකරන සෑම මේසම සින්ක් තහඩුවලින් වැසිය යුතුයි. එබඳු මේස සහ මස් කපන කොට යද අනික් උපකරණ සියල්ලමද ඉතා පිරිසිදුව තැබිය යුතුයි. ඒවා පාවිච්චිකර ඉවරවූ ඇසිල්ලේම වතුරෙන් සෝදා තදවූ පිරිසිදු බුරුසුවකින් මැද්ද යුතුයි. මස් එල්ලා තිබෙන කොකුසියල්ලම හොඳාකාර මැද මලකඩ නැතුව තැබිය යුතුයි.

22. (b) අහකයන්නාවූද විකිණිය නොහැකි ද්‍රව්‍යයන්ද ලේකැටි ආදියද වහාම ඉවත්කරනු නොලැබේනම් සින්ක් තහඩු ඇතුළත අල්ලනලද මැස්සන්ට යාමට නොහැකිවනාකාර සිදුරුවලින් යුක්ත පෙට්ටියක දමා තැබිය යුතුයි. තවද එම පෙට්ටිය පාවිච්චිකළාසින් පසු හිස්කර සෝදා පිරිසිදු කළයුතුයි.

[9 E 2 (t) යන වගන්තියයි.]

කෑලෑඋන වැළැක්වීම.

36. (a) වාසයකරන ස්ථානවල තිබෙන භාජනවල වතුර තුන් දවසකට වඩා ඉවත් නොකර කිසිවෙකු විසින් තිබිය යුතු නොවේ.

36. (b) යම් ලිඳක හෝ වතුර එකතුවී තිබෙන්නාවූ ස්ථානයක මදුරුවන්ගේ බීජ තිබෙනවා දැනගන්ට ලැබුනොත් සභාපතිතැනට එය වැළැක්වීම පිණිස ක්‍රියාකරන්ට බලය තිබේ.

**සිසිල්බීම වගී.**

44. සනීපාරක්‍ෂක සභාවට අයත් මායිම්තුළ සභාවේ ප්‍රධානතැනට මාසයකට ප්‍රථම ලියවිල්ලකින් දැනුම්නොදී (එයරේටඩ් වෝටර්ස්) නමැති සිසිල්බීම වෙළඳාම පිණිස සෑදීමට කිසිවෙකු විසින් ආරම්භ නොකළයුතුයි.

45. ගාලකට ස්ථාලයකට හෝ දිවාරුංදෙක්ති සතුන් නවත්වන පිණිස පාවිච්චිකරන වෙනත් ගොඩනැගිල්ලකට හෝ වැසිකිලියකට අඩුගණනේ අඩි 150කට දුරින් සිසිල්බීම සාදන ස්ථානයක් පිහිටා තිබිය යුතුයි. එම කර්මාන්ත ශාලාවේ කිසියම් කොටසක් වාසස්ථානයක් හැටියට පාවිච්චි නොකළයුතුයි.

46. සිසිල්බීම වගී සාදන පිණිස පාවිච්චිකරන සියලුම ස්ථාන හොඳාකාර එළිය ඇතිවන අන්දමටද වාතය ඇතුල්වන අන්දමටද තබා වහලට ලීවලින් සීලින් දමා තිබියයුතුයි. බිමට සිමෙන්ති දමා අප්‍රයෝජන ද්‍රව්‍ය පිටකිරීම පිණිස හොඳාකාර තනනලද කානු තිබෙන්ට ඕනෑවා සහ කුණු කසල සහ දූවිලි නැතුව පිරිසිදුලෙසද තිබෙන්ට ඕනෑය. පැණිවගී සෑදීම මැස්සන්ට ඇතුල්විය නොහැක්සේ සාදනලද වෙනම කාමරයක කළයුතුයි. තවද එහි පාවිච්චිකරනු ලබන බෙහෙත්වගීද, අන්‍ය ද්‍රව්‍යයන්ද හොඳ ඒවා වියයුතුයි. සියලුම භාජන සහ යන්ත්‍ර ඉතා සැලකිල්ලෙන් පිරිසිදුව තබාගතයුතුයි.

47. බීම සෑදීම පිණිස ගන්නා වතුර අපිරිසිදුවිය නොහැකි අන්දමට හොඳට ආරක්‍ෂාකරණලද සහ සභාවේ සභාපතිතැන විසින් යෝග්‍යයයි පිළිගනුලැබුවාවූද ස්ථානයකින් ගතයුතුයි එම වතුර කර්මාන්තශාලාවට ගෙනඒමේදී දූෂ්‍ය නොවන අන්දමට ගෙනයියයුතුයි. සිසිල්බීම සාදන යන්ත්‍ර සම්බන්ධවූ හරියාකාර සෑදුවාවූ ටැන්ක්වලට නොහොත් දූවිලි නොවදිනාසේ වසන ලද්දාවූ ජලාසවලට ඒවතුර රැස්කොට තැබියයුතුයි.

48. මේ සඳහා ගන්නාවතුර සභාවේ සභාපතිතැන විසින් ඒත්තුගනුලැබුවාවූද යන්ත්‍රයට සම්බන්ධ ජැවල් හෝ අන්කිසි වගීයක වතුර පෙරන පිල්ටරයකින් නොහොත් භාජනයකින් පෙරන්ට ඕනෑවේ. පොදු ජනයාට වතුරදෙන යෝග්‍යයයි බාර ගත් ස්ථානයකින් බීම සෑදීමට වතුරගන්නේනම් එසේ ගනු ලබන වතුර මේ අණපනතට යටත් නොකිරීමට සභාපතිතැනට බලය තිබේ.

49. සිසිල්බීම පුරවන පිණිස පාවිච්චිකරන සියලුම බෝතල පෙරාපුවතුරෙන් සේදියයුතුවත් හැර ඉතාමත් පිරිසිදුව තිබෙන්ට ඕනෑය.

50. සිසිල්බීම පුරවනලද සියලුම බෝතලවල එහි ඒ වගීයේ නමද සාදනලද ස්ථානයද එය සාදනලද කර්මාන්තශාලාව අයිතිකාරයාගේ හෝ සමාගමේ නමද ඊට සමීප ආරක්‍ෂක සභාවේ සභාපතිතැන විසින් දෙනලද නොම්මරයද සඳහන් ලේබල් එකක් අලවා තිබියයුතුයි.

51. අවුරුදු දොළහෙන් පහළ කිසිවෙක්ද බෝවෙන රෝගයකින් හෝ කුෂ්ඨ රෝගයකින් පෙළෙන්නාවූ කිසිවෙක් සිසිල්බීම හෙවත් එයරේටඩ් වෝටර්ස් සාදන කර්මාන්ත ශාලාවක වැඩක යොදන්ට යුතුනැත.

52. සිසිල්බීම බෝතලවල ගෑස් පුරවන වැඩේ යෙදී සිටින සියලුමදෙන ඒවේලාවේදී සියුම් කම්බිවලින් සාදනලද සිදුරු සහිත මුහුනුවැස්මක්ද හම්වලින් සාදනලද අත්මේස්ද ඇඳසිටිය යුතුයි.

ලින්.

53. සනීපාරක්‍ෂක සභාවක් පිහිටි නගරයක සීමාවතුළ යමෙකු විසින් ලිඳක් කිඳීමට හෝ කිඳවීමට මාසයකට ප්‍රථම එම සභාවේ සභාපතිතැනට නොදක්වා හෝ එම සභාපතිතැනගෙන් ඊට අවසරපත්‍රයක් නොලබා ලිඳක් කැණීම හෝ කැණවීම නොකළයුතුයි.

54. බීමට හෝ වෙනත් ගෙදරවැඩවලට වතුරගන්නා යම් ලිඳක් වතුර ඉස්සවා සුඬකර වෙනත් උවමනා රෙපෙයාරු වැඩ කළයුතු බව සනීපාරක්‍ෂක සභාවේ සභාපතිතැනට වැටහේනම් එසේ කිරීමට නියමකර ලියනලද ආඥාවක් එම ලිඳ අයිතිකාරයාට හෝ බද්දකාරයාට එවියයුතුයි. දවස් 14ක් තුළදී ඔහු එම අණ පිළිනොපැද්දේවිනම් ඔහු නීතියට විරුඬ ක්‍රියාවකට වැරදිකාරයෙක් වේ.

55. යම් විටක සනීපාරක්‍ෂක සභාවේ යෝජනාවකින් සනීපාරක්‍ෂාව පිණිස යම් ලිඳක් වැසීමට හෝ බෝවෙනලෙඩ වැළැක්වීම පිණිස සුඬකිරීමට යෝග්‍ය බව තීන්දුකර ගතිනම් එවැනි ලිඳක් ඉඩම අයිතිකාරයාට නොහොත් බද්දකාරයාට හෝ භාරකාරයාට එසේ කිරීමට අණකොට ලියනලද ආඥාවක් යැවියයුතුවා පමණක් නොව එම ආඥාවේ ප්‍රකාරයට අට දවසකින් එම වැඩකිරීමට අයිතිකාරයා හෝ භාරකාරයා බැඳී සිටිත්. යම් අයිතිකාරයෙක් බද්දකාරයෙක් හෝ පදිංචිකාරයෙක් එකී කාලය ඇතුළත එකී ආඥාව අනුව ක්‍රියාකරන්ට නොයෙදුනොත් ඔහු වරදකාරයෙක් වේ.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

No. 3,844, S. P.—දකුණු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1921ක්වූ දෙසැම්බර් මස 22වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ ගගබොඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

සිතියම 11,855. ගම—කැප්පිටියගොඩ. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | කරන්දගොඩගුලන .. | — .. | .. කැලේ | .. 115 | 3 | 9 | 75 |
| 28 | බලපුහේන, දෙලොස්හවුලේහේන, නොහොත්, රටවෙලකම්පොත්තහේන | — .. | .. එම | .. 96 | 1 | 27 | 75 |
| 37 | මිල්ලගහහේන නොහොත් පුහුල්හේන නොහොත් අන්නාසිගලහේන | — .. | .. එම | .. 58 | 0 | 30 | 75 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ දකුණු පලාතේ මහඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1921ක්වූ නොවැම්බර් මස 7වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ග්‍රීම් තොම්සන්,
මහසෙක්‍රතාරිස්ව සිත.

---

No. 3,845, S. P.—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1921ක්වූ දෙසැම්බර් මස 22වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | මුල් සිතියම 11,719. ගම—පැලෑගස්පලාන. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 8 | අල්පෝරුකන්දේලවල .. | කොස්ගොඩ පදිංචි ජේම්ස් ප්‍රෙරා වික්‍රමරත්න | බැද්ද | .. 1 | 3 | 30 | 82 |
| 9 | එම .. | කුමාරසිංහ මාර්ටින් ද සොයිසා කොස්ගොඩ | එම | .. 1 | 3 | 26 | 82 |
| 10 | අල්පෝරුකන්දේඅද්දරමානාන | එම .. | .. වත්ත | .. 1 | 1 | 14 | 80 |
| | | | වැවිල්ල | .. | — | | 1·50 |
| 11 | එම .. | එම .. | .. දෙනිය | .. 0 | 3 | 5 | 80 |
| 12 | එම .. | එම .. | .. එම | .. 0 | 1 | 17 | —* |
| | මුල් සිතියම 11,724. ගම—වලිහුරුකැටිය. | | | | | | |
| 1 | කුරුකැටියේකැලේ නොහොත් වලිහුරුකැටියකැලේ | කොස්ගොඩ පදිංචි සී. ඈම්. අබේසේකර .. | බැද්ද | .. 3 | 0 | 19 | 90 |
| 2 | එම .. | එම .. | .. එම | .. 0 | 0 | 21 | —* |
| | අයිතිකමකියන්නා. සුබයාහකුරු මෙසිසෙර වලිහුකැටියේ පදිංචි. | | | | | | |
| 3 | කැරකැටියේ කුඹුරේඔිවිට .. | කොස්ගොඩ පදිංචි සී. ඈම්. අබේසේකර .. | ඔිවිට | .. 0 | 0 | 23 | 60 |
| | මුල් සිතියම 11,849. අයිතිකමකියන්නා—වලිහුරුකැටියේ පදිංචි පත්තිනියාහකුරු සමාරිස්. | | | | | | |
| 1 | දෙල්ගහවත්ත .. | කොස්ගොඩ පදිංචි සී. ඈම්. අබේසේකර .. | පොල්වැවිච්ච | .. 0 | 1 | 23 | 80 |
| | | | වැවිල්ල | .. | — | | 28·10 |
| | අයිතිකමකියන්නා රජසන්තක. | | | | | | |
| 2 | එම .. | කොස්ගොඩ පදිංචි සී. ඈම්. අබේසේකර .. | වත්ත | .. 0 | 0 | 5 | —* |
| | අයිතිකමකියන්නා—වලිහුරුකැටියේ පත්තිනියාහකුරු සමාරිස්. | | | | | | |
| 3 | කසිලත්තේඔිවිට .. | කොස්ගොඩ පදිංචි සී. ඈම්. අබේසේකර .. | වතත | .. 0 | 0 | 28 | 80 |
| | | | වැවිලල | .. | — | | 15 |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 4 | කසිලත්තේමානාන නොහොත් මීගස්පිටියේබැද්ද | කොස්ගොඩ පදිංචි සී. ඈම්. අබේසේකර .. | බැද්ද | .. 0 | 0 | 21 | —* |
| 5 | එම .. | එම .. | .. එම | .. 3 | 2 | 12 | 100 |
| 6 | කසිලත්තේමානාන නොහොත් කෙබනවෙලබැද්ද | එම ... | .. එම | .. 2 | 0 | 16 | 100 |
| 7 | කසිලත්තේ කැලේ නොහොත් මීගස්පිටියේලාවල | කොස්ගොඩ පදිංචි සී. ඈම්. අබේසේකර .. | එම | .. 1 | 3 | 23 | 100 |
| | මුල් සිතියම 11,725. | | | | | | |
| 1 | කිරිමැටියාවේකැලේ .. | වැලිතර පදිංචි නිකුලස් ද ආබ්‍රෙව් .. | මහබැද්ද | .. 5 | 0 | 26 | 67·50 |
| 2 | එම .. | එම .. | .. එම | .. 0 | 0 | 10 | —* |
| 3 | කෝන්ගහඋඹුමුලඅඳුරකැලේ නොහොත් කිරිමැටියාවේ කැලේ | වලිහුරුකැටියේ පදිංචි දෙලිස් .. | සුලුබැද්ද | .. 1 | 0 | 1 | 60 |
| 4 | එම .. | එම .. | .. එම | .. 0 | 0 | 12 | —* |
| | අයිතිකමකියන්නා—සුදුහකුරු ලයනේරිස්. | | | | | | |
| 5 | දෙල්ගහවත්ත .. | වලිහුරුකැටියේ පදිංචි තොම්මයාහකුරු දෙලිස් | හම්මුන්ගේවත්ත | 0 | 2 | 38 | 50 |
| | | | වැවිල්ල | .. | — | | 58·55 |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 6 | කිරිමැටියාවේකැලේ .. | ඌරගහ පදිංචි ඩී. ඈස්. ඩී. ඉසැඩ්. ජයවර්ධන විදානේආරච්චි | සුලුබැද්ද | .. 1 | 0 | 13 | 55 |

* තහනම් ඉඩම්. (විකුණන්නේනැත)

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ දකුණු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1921ක්වූ නොවැම්බර් මස 7වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ග්‍රීම් තොම්සන්,
මහසෙක්‍රතාරිස් වමිය.

**No. 3,846, S. P.**—දකුණු දිසාවේ ගාළු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1922ක්වූ ජනවාරි මස 5වෙනි දිනවූ බෘහස්පතින්දා, පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ ගංගබඩපත්තු සහ වැල්ලබඩපත්තු කොට්ඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 16ක්.

සිතියම 11,216. ගම—පටවැලිවිටිය. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ලෙනේමල්ඇලකන්ද නො හොත් ලෙනේමල්වත්ත කරතුරේ | මාජුවානෙගම්ගෙයි හින්නේරිස් .. | මහබැද්ද .. | 1 | 1 | 33 | 45 |

සිතියම 11,544. ගම—බටපොල, වැල්ලබඩපත්තුවේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කොන්ඩගල්කැලේ නො හොත් දික්මුල්ලේකැලේ | පේදුරුහේවා එන්දෙරිස් සිල්වා, බටපොල | සුළුබැද්ද .. | 1 | 0 | 0 | 110 |

ගම—දිවිතුරේ, ගංගබඩපත්තුවේ. අයිතිකමකියන්නා—බටපොල පී. එච්. එන්දුරිස් සිල්වා.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | නාවලකන්දඅද්දරකුඹුර .. | පේදුරුහේවා එන්දෙරිස් සිල්වා, බටපොල | පොසිපල .. | 1 | 0 | 5 | 50 |

ගම—බටපොට, වැල්ලබඩපත්තුවේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | එම .. | පේදුරුහේවා එන්දෙරිස් සිල්වා, බටපොල | පොසිපල සහ රබර් ඉඩම | 0 | 3 | 37 | 100 |
| | | | වැවිල්ල ... | — | | | 12 |

ගම—දිවිතුරේ, ගංගබඩපත්තුවේ. අයිතිකමකියන්නා—බටපොල කේ. අන්දිරිස්අප්පු.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | නාවලකන්දෙවෙල .. | පේදුරුහේවා එන්දෙරිස් සිල්වා, බටපොල | පොසිපල .. | 0 | 0 | 22 | 50 |

සිතියම 11,573. ගම—ගම්මැද්දේගොඩ, ගංගබඩපත්තුවේ. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | රදලගෙදෙනිය නොහොත් රදලගෙගොඩ | ගම්මැද්දේගොඩ එමගමගෙයි එන්දිරිස් | හේන .. | 3 | 1 | 31 | 50 |

සිතියම 11,639. ගම—පටවැලිවිටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | වවුලාගලකන්ද .. | පටවැලිවිටියේ ඩේවිඩ් විජේරත්න .. | බැද්ද .. | 1 | 0 | 13 | 42·50 |
| 2 | එම .. | එම .. | එම .. | 1 | 0 | 18 | 42·50 |

සිතියම 11,757. ගම—ඉහලකිඹිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | පනාම්ගකුඹුරේගොඩ .. | ගාල්ලේ කොටුවේ ඩී. ඇස්. ගුනසේකර මිනින්දෝරුතැන | එම .. | 5 | 0 | 19 | 65 |

සිතියම 11,786. ගම—පහලකිඹිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | වරකාපිටිකන්ද .. | ඒ. ඩබ්ලිව්. වින්ටර් මහතා .. | සුද්දකරපු බිම .. | 1 | 1 | 27 | 60 |
| 2 | එම .. | එම .. | එම .. | 0 | 0 | 26 | —* |
| 3 | එම .. | එම .. | එම .. | 0 | 3 | 33 | 60 |

අයිතිකමකියන්නා—බී. ජී. කරෝලිස්අප්පු.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | ගොසිරාලගේවත්ත .. | ඒ. ඩබ්ලිව්. වින්ටර් මහතා .. | පලවැලවත්ත .. | 0 | 0 | 23 | 60 |

අයිතිකමකියන්නා—තල්පෙලියනගෙයි අර්නෝලිස්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 5 | එම .. | ඒ. ඩබ්ලිව්. වින්ටර් මහතා .. | වත්ත .. | 0 | 0 | 14 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 2 |

සිතියම 11,788. ගම—මාබොටුවන. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගහලගොඩවත්තඅද්දරවත්ත | ලේල්වල ලේල්වලගුරුගේ කරෝලිස් .. | සුළුබැද්ද .. | 0 | 2 | 8 | 45 |

සිතියම 11,801. ගම—පටවැලිවිටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | හල්කන්දෙවිලේකන්ද .. | වල්පිටවත්තේ සෑම් ඒ. ඩී සිල්වා .. | බැද්ද .. | 0 | 1 | 27 | —* |
| 2 | එම .. | එම .. | එම .. | 14 | 0 | 6 | 57·50 |

අයිතිකමකියන්නා—බද්දේගම ජී. ඕර්ලිස්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | හල්කඩවිලවත්ත .. | වල්පිටවත්තේ සෑම් ඒ. ඩී සිල්වා .. | රබර් වැවිච්ච .. | 0 | 1 | 10 | 50 |
| | | | වැවිල්ල .. | — | | | 1·50 |
| 4 | හල්කඩවිලකන්ද .. | එම .. | බැද්ද .. | — | | | —† |

* තහනම් ඉඩම්. (විකුණන්නේ නැත) † ආණ්ඩුවට අයිති නැති ඉඩම. (විකුණන්නේ නැත.)

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා දකුණු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1921ක්වූ නොවැම්බර් මස 7වෙනි දින කොළඹ මහලේකම්කාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ග්‍රීම තොම්සන්,
මහලේකම්කාරිස් වෙනුවට.

---

**No. 3,847, S. P.**—දකුණු දිසාවේ ගාළු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1922ක්වූ ජනවාරි මස 17වෙනි දිනවූ අඟහරුවාදා, පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ තල්පෙපත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 33ක්.

මුල් සිතියම 10,440. ගම—දික්කුඹුර. අයිතිකමකියන්නා—දික්කුඹුරේ ජූලියන්ලැම්බියස්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2 | පනුහල්ගොඩවත්ත .. | වෙත්තණගේ අරනෝලිස් අප්පු .. | වත්ත .. | 0 | 0 | 23 | 60 |

මුල් සිතියම 10,001. ගම—බස්නාහිර උනවටුන. අයිතිකමකියන්නා—උනවටුනේ වී. අමරසූරිය මහතා.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | පරදූවවත්ත අද්දර කැබැල්ල | — .. | වත්ත .. | 0 | 0 | 9 | 500 |
| | | | වැවිල්ල | — | | | 2 |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | **මූල් සිතියම 10,855. ගම—කිත්තගල්ල. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | | |
| 1 | යවගහකැලේ .. | රත්ගම දොන්. අරනෝලිස් තිලකරත්න .. | සුළුබැද්ද .. | 6 | 2 | 37 | 120 |
| 2 | එම .. | එම .. .. | එම .. | 2 | 3 | 22 | 120 |
| | **මූල් සිතියම 10,890. ගම—මාවැල්ල.** | | | | | | |
| 1 | තල්ගහේඋඹුල්ලෙගොඩ .. | ඇම්. ජී. ඩබ්ලිව්. ඩී. තොරෝනිස් අප්පු .. | පතන .. | 4 | 1 | 12 | 62·50 |
| | **මූල් සිතියම 10,978. ගම—කොච්චව.** | | | | | | |
| 3 | ඊරියගහඋඹුමූල්ලෙකන්ද නොහොත් දෙනියෙ උඹුමූල්ලෙ කන්ද | ගාල්ලේ ජී. වෙත්තිවෙල් මහතා .. | බැද්ද .. | 7 | 1 | 25 | 80 |
| | **මූල් සිතියම 11,023.** | | | | | | |
| 1 | මාරගහමුලන .. | බී. කේ. ජෙහානිස් .. .. | හේන .. | 2 | 0 | 4 | 66 |
| 2 | එම .. | ජී. කේ. තෙදෙුරිස් .. .. | එම .. | 1 | 0 | 5 | 66 |
| | **මූල් සිතියග 11,150. ගම—උඹුමලගල.** | | | | | | |
| 8 | වෙරලුගහදෙනිය සහ වෙරලුගහ දෙනියෙගොඩ | උනව්වූගේ සරනේලිස් ගුනසේකර .. | දෙනිය සහ බැද්ද | 1 | 0 | 29 | 62·50 |
| | **මූල් සිතියම 11,212. ගම—බෙරනගොඩ.** | | | | | | |
| 2 | ගල්බොඩහේන .. | බෙරනගොඩකාරිය වසන්මානගේ සියදෙුරිස්.. | බැද්ද .. | 0 | 3 | 29 | 62 |
| | **මූල් සිතියම 11,212. අයිතිකමකියන්නා—බෙරනගොඩ කාරියවසන්මානගේ සියදෙුරිස්.** | | | | | | |
| 3 | ගලබොඩහේන .. | බෙරනගොඩ කාරියවසන්මානගේ සියදෙුරිස්.. | වත්ත .. | 0 | 0 | 24 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 3 |
| | **අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | | |
| 5 | ගල්බොඩකුඹුරේගොඩ .. | බෙරනගොඩ කාරියවසන්මානගේ සියදෙුරිස්.. | හේන .. | 0 | 0 | 26 | 61 |
| | **මූල් සිතියම 11,282. ගම—කොච්චව. අයිතිකමකියන්නා—කොච්චවගමගේ තෙවෙරිස්.** | | | | | | |
| 1 | එලියස්සෙගොඩවත්ත .. | — .. .. | වත්ත .. | 0 | 0 | 22·6 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 3·50 |
| | **මූල් සිතියම 11,298 ගම—උතුරුමල්ලගොඩපිටිය. අයිතිකමකියන්නා—මල්ලගොඩපිටිගේ ඇන්. වී. දොනා ගිමාරා.** | | | | | | |
| 2 | මාදගොඩ .. | මල්ලගොඩපිටිගේ ඇන්. ඩබ්ලිව්. දොන් චාර්ලිස් | වත්ත .. | 0 | 1 | 7 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 6·20 |
| | **අයිතිකමකියන්නා—ඇස්. කේ. මැන්දිස් අප්පු සහ තවත් අය.** | | | | | | |
| 4 | එම .. | මල්ලගොඩපිටිගේ ඇන්. ඩබ්ලිව්. දොන් චාර්ලිස් | වත්ත .. | 0 | 1 | 28 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 26 |
| 5 | එම .. | එම .. .. | වත්ත .. | 0 | 1 | 1 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 10 |
| | **මූල් සිතියම 11,303. ගම—වල්පොල. අයිතිකමකියන්නා—වල්පොල ඩී. ඒ. ඩබ්ලිව්. සමරසේකර.** | | | | | | |
| 4 | වවුල්කැටේවත්ත .. | වල්පොල ඩී. ඒ. සමරසේකර .. | වත්ත .. | 0 | 0 | 17 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 11·90 |
| | **මූල් සිතියම 11,532. ගම—උඹුමලගල. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | | |
| 1 | වෙලිකැටියෙකන්ද නොහොත් බෙලිඅකුලේගොඩ | නාකියාදෙනිගේ උඹුමලගලගමගේ එන්දිරිස් .. | සුළුබැද්ද .. | 1 | 3 | 28 | 50 |
| | **මූල් සිතියම 11,535.** | | | | | | |
| 1 | ගහලකොලදෙනිගේගොඩ .. | උඹුමලගලගමගේ ඩයස් .. .. | සුළුබැද්ද .. | 2 | 0 | 21 | 61 |
| | **මූල් සිතියම 11,614. ගම—තෙලඹුරේ. අයිතිකමකියන්නා—තෙලඹුරේ දෙඩම්පෙගමගේ වෙලිස්අප්පු.** | | | | | | |
| 1 | වෙරළුගහදෙනිය .. | — .. .. | රබර් වැවිච්ච | 0 | 0 | 36 | 35 |
| | | | වැවිල්ල .. | — | | | 6·80 |
| 2 | එම .. | උඹුමලගලගමගේ ඩයස් .. .. | රබර් වැවිච්ච | 0 | 3 | 15 | 35 |
| | | | වැවිල්ල .. | — | | | 10·55 |
| | **මූල් සිතියම 11,683. ගම—පරගොඩ. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | | |
| 1 | මහකුඹුරේ ගොඩ නොහොත් වෝහගේගොඩ | පරගොඩ මහකන්තිරිගේ කරෝලිස්අප්පු .. | බැද්ද .. | 3 | 3 | 16 | 85 |
| | **අයිතිකමකියන්නා—(1) මිදිගස්පේගේ මාටින්. පරගොඩ, (2) පරගොඩ බමවලගමගේ සින්ඤොඅප්පු.** | | | | | | |
| 2 | එම .. | පරගොඩ මහකන්ත්‍රිගේ කරෝලිස් අප්පු .. | රබර් වැවිච්ච | 0 | 2 | 14 | 62 |
| | | | වැවිල්ල .. | — | | | 6 |
| | **මූල් සිතියම 11,689. ගම—අගුළුගහ. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | | |
| 1 | කිතුල්ගහවලබැද්දෙඅද්දර දෙනියෙ ගොඩ | ගාල්ලේ කොටුවේ ජේ. ඒ. ලූඩොවයික් මහතා | සුළුබැද්ද .. | 2 | 3 | 25 | 75 |
| | **මූල් සිතියම 11,688 ගම—නැගෙනහිර හරුමල්ගොඩ. අයිතිකමකියන්නා—කේ. වී. දනෝරිස් අප්පු සහ තවත්අය.** | | | | | | |
| 1 | කෝන්ගහවතත අද්දරබැද්දෙ නොහොත් තල්ගහ කුඹුරේ අද්දරබැද්ද | මීපේ පැලකැටියෙගෙයි බබුන්අප්පු .. | වතත .. | 1 | 0 | 2 | 60 |
| | | | වැවිල්ල .. | — | | | 7·25 |
| 2 | එම .. | එම .. .. | වතත .. | 2 | 0 | 10 | 70 |
| | | | වැවිල්ල .. | — | | | 33·65 |
| | **අයිතිකමකියන්නා—කොග්ගල ලමාහේවාගේ ලූවිස්අප්පු.** | | | | | | |
| 3 | නිතාදවත්ත .. | මීපේ පැලකැටියෙගෙයි බබුන්අප්පු .. | වතත .. | 0 | 0 | 33 | 50 |
| | | | වැවිල්ල .. | — | | | 20 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | **මුල් සිතියම 11,758. ගම—තෙල්ලඹුරේ. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | | |
| 1 | සිල්ලන්ඹුරේඅද්දරණ්ගොඩ නොහොත් පහලමුලගෙන්දුව | — | මුඩුබිම | 0 | 0 | 12 | —* |
| | **මුල් සිතියම 11,768. ගම—හබදුව.** | | | | | | |
| 1 | රප්පනාවේගොඩ නොහොත් කොටපොලගොඩ | ගාල්ලේ සරෙන්තුකොඩි සී. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා බාරේ ජේ. ඒ. සහබන්දු මහත්මයා | බැද්ද | 11 | 0 | 8 | 70 |
| | **මුල් සිතියම 11,754. ගම—හොරදූගොඩ.** | | | | | | |
| 1 | මර්වෙගොඩ | බඹරවනේගෙයි කුරුන්හාමි බටදූවේ | බැද්ද | 7 | 1 | 18 | 55 |
| | **අයිතිකමකියන්නා—හොරදූගොඩ එච්. ජී. දෙන් කරෝලිස් සහ තවත්අය.** | | | | | | |
| 2 | එම | බඹරවනේගෙයි කුරුන්හාමි බටදූවේ | සුඩකරපුබිම | 0 | 2 | 2 | 50 |
| | | | වැවිල්ල | | | — | 1·50 |
| | **අයිතිකමකියන්නා—වැල්ලබඩපත්තුවේ මිරියාගොඩ පදිංචි කරුණාවර්ධන නෝනාමහත්මී.** | | | | | | |
| 3 | එම | බඹරවනේගෙයි කුරුන්හාමි බටදූවේ | කුරුදු | 0 | 0 | 21 | 50 |
| | | | වැවිල්ල | | | — | 3 |
| | **අයිතිකමකියන්නා—හොරදූගොඩ කේ. ඒ. පොඩිඅප්පු සහ තවත්අය.** | | | | | | |
| 4 | එම | බඹරවනේගෙයි කුරුන්හාමි බටදූවේ | ඇල්වී, මයිකොක්කා යනා දිය වැවිච්ච | 0 | 1 | 28 | 50 |
| | **මුල් සිතියම 11,802. ගම—පොල්පොගොඩ. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | | |
| 1 | අන්නාසිගලහේනේ කොටිගල කන්ද නොහොත් දිගහේන | පොල්පොගොඩ කේ. කේ. අයි. ද සිල්වා | බැද්ද | 0 | 3 | 35 | 65 |

* තහනම් ඉඩම්. (විකුණන්නේ නැහැ.)

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ දකුණු පලාතේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1921ක්වූ නොවැම්බර් මස 9වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ග්‍රීම් තොම්සන්,
මහලේකම්තාරිස් වම්හ.

---

